# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2016
## 13 ශ්‍රේණිය
## දේශපාලන විද්‍යාව
### I කොටස

කාලය පැය 2 යි.

නම: ........................................................................................ අංකය:- ................ පන්තිය:- ..........

- ප්‍රශ්න අංක. 01 සිට 10 දක්වා තිබෙන ප්‍රකාශ අතුරෙන් අදාළ ප්‍රශ්නයේ මාතෘකාවට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

01) දේශපාලනය අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ,
   1) ආණ්ඩුව හා එහි වැඩකටයුතු දැනගැනීමට
   2) අයිතිවාසිකම් ගැන දැනගැනීමට
   3) දේශපාලන කරුණු පිළිබඳව අගය විනිශ්චය කිරීමට
   4) තාර්කික දේශපාලන සත්ත්වයකු වීමට
   5) සමාජයේ සංස්කෘතික සාරධර්ම ගැන දැනුම වර්ධනය කරගැනීමට

(............)

02) චර්යාවාදයේ මූලිකාංගවලට අදාළ ප්‍රකාශය තෝරන්න.
   1) සදාචාරාත්මක අගය කිරීම් අධ්‍යයනය කිරීම.
   2) හැසිරීම් කේන්ද්‍ර කරගත් එකක් වීම.
   3) විද්‍යාත්මක බාහිර දැක්මක් තිබීම.
   4) අන්තර් විෂයාත්මක ප්‍රවේශය
   5) ප්‍රත්‍යක්ෂ මූලික සාධක මත පදනම් වීම.

(............)

03) නාගරික රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණයකි.
   1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පදනම් කොටගෙන ගොඩනැගී තිබීම.
   2) ඒ තුළ වාසය කළ සියලු දෙනාටම දේශපාලන අයිතිවාසිකම් හිමිවීම.
   3) දේශපාලන ක්‍රියාදාමයට සහභාගී වීමට ඉඩ ලැබුණේ පුරවැසියන් පමණක් සහභාගී වීම.
   4) ආණ්ඩුවේ වැඩ කටයුතු කාර්යාත්මක වශයෙන් බෙදා නොතිබීම.
   5) පැරණි ග්‍රීසිය තුළ පැවති රාජ්‍ය ක්‍රමයකි.

(............)

04) රාජ්‍යය,
   1) දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් ප්‍රජාවකි.
   2) පුද්ගලයින් හා ඔවුන්ගේ සංවිධානවලට වඩා උත්තරීතර වන්නේ ය.
   3) ආණ්ඩුවේ දේශපාලන හස්තය වන්නේ ය.
   4) ස්වාධිපති බලයේ තනි උරුමකරුවා වන්නේ ය.
   5) සමාජයට පසුව බිහිවී ඇත.

(............)

05) සමාජ සංවිධාන,
   1) තම සාමාජිකයින් කෙරෙහි අසහාය බලයක් භුක්ති විඳී.
   2) පුද්ගලික අරමුණු නියෝජනය කරනු ලබයි.
   3) ඉටුකරන්නේ සමාජ කාර්යයන් පමණි.
   4) නිදහස් පැවැත්මක් ඇත.
   5) රාජ්‍යයේ කැමැත්තට යටත්ව ක්‍රියාත්මක වේ.

(............)

06) සමාජය,
   1) සමාජය ස්වභාවික දෙයකි.
   2) සමාජයට භෞමික සීමාවක් නොමැත.
   3) සමාජය සමන්විත වන්නේ මිනිසුන් විසින් ගොඩනගා ඇති සියලු සමාජ සංවිධානයන්ගෙනි.
   4) සමාජය ගොඩනැගී ඇත්තේ එහි සාමාජිකයින්ගේ අනිවාර්යය සහයෝගය මතය.
   5) සමූහගත වී ජීවත් වීමට මිනිසුන් තුළ ඇති කැමැත්තේ ප්‍රතිඵලයකි.

(............)

07) ජාතිය,

1) නිශ්චිත දේශ සීමාවන්ගෙන් යුත් භූමියක පදිංචි මිනිසුන්ගේ එකතුවක් වේ.
2) දේශපාලන වශයෙන් ස්වාධීන වේ.
3) හඳුනාගන්නේ සාමාජිකයින්ගේ වර්ණය අනුවය.
4) එක් ජනවාර්ගික කොටසකින් හෝ කිහිපයකින් සමන්විත විය හැකිය.
5) පොදු දේශපාලන අභිමතාර්ථ හා ආශාවන් බෙදා ගනියි.

(............)

08) ආණ්ඩුවේ කාර්යයන් නොවන්නේ,

1) පුරවැසියන්ගේ අයිතිවාසිකම් මර්දනය කිරීම.
2) නීතිය හා සාමය පවත්වාගෙන යාම.
3) ජාතික ආරක්ෂාව හා දේශපාලන නිදහස ආරක්ෂා කිරීම.
4) පුරවැසියන්ට මූලික සුබසාධන පහසුකම් සැපයීම.
5) ආර්ථිකය කලමනාකරණය කිරීම.

(............)

09) රාජ්‍යය හා සමාජය අතර වෙනස දැකිය හැක්කේ,

1) රාජ්‍යය මගින් දේශපාලන ක්‍රමය ද සමාජය මගින් සමාජ ක්‍රමය ද නිරූපණය කරනු ලැබේ.
2) රාජ්‍යයට ස්වාධිපති බලය හිමි වුව ද සමාජයට නොමැත.
3) සමාජය රාජ්‍යයට වඩා පුළුල් දෙයක් වේ.
4) රාජ්‍යය සමාජයට ප්‍රථමයෙන් බිහිවී ඇත.
5) සමාජය ස්වභාවික දෙයක් වන අතර රාජ්‍යය කෘතිම දෙයකි.

(............)

10) සිවිල් සමාජය ආශ්‍රිත ප්‍රධාන අංගයකි.

1) නොබෙදුනු ආශාවන්
2) සාමූහික ක්‍රියාවන්
3) බලය යෙදීමෙන් තොරවීම.
4) අනන්‍යතාවය
5) දේශසීමා නිශ්චිත ලෙස හඳුනා ගැනීමට නොහැකි වීම.

(............)

- **ප්‍රශ්න අංක. 11 සිට 20 දක්වා ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශ අතුරෙන් එකක් සාවද්‍යවේ. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

11) ලිබරල් න්‍යායට අනුව රාජ්‍ය වූ කලි,

A- සමාජ සංවිධානයක් වේ.
B- සාමූහික කැමැත්ත නියෝජනය කරනු ලැබේ.
C- අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය විශේෂ වරප්‍රසාද භුක්ති නොවිඳියි.
D- සියලු දෙනාටම සමානව සැලකීම සහතික කරනු ලැබේ.
E- රාජ්‍ය ස්ථාවර දෙයක් වේ.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

12) මාක්ස්වාදයට අනුව රාජ්‍යය,

A- රාජ්‍යය පංති උපකරණයක් වේ.
B- රාජ්‍යය සෑම සමාජ පංතියකටම සමානව සේවය කරයි.
C- කොමියුනිස්ට් සමාජ ක්‍රමය තුළ රාජ්‍යය වියැකී යයි.
D- බිහිවූයේ සමාජය පංතිවලට බෙදීයාමේ හේතුවෙනි.
E- පූර්ව කොමියුනිස්ට් යුගය තුළ රාජ්‍යය නොපැවතුනි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

13) පැසිස්ට් න්‍යායට අනුව රාජ්‍යය,

A- මිනිසුන් විසින් නිමවා ඇති අන්‍ය සියලුම සංවිධානවලට වඩා උසස් ය.
B- පුද්ගලයින්ට හා සමාජයට ඉහළින් අසාභය බලයක් භුක්ති විඳී.
C- ස්වකීය වූ කැමැත්තක් සහ අරමුණු සමූහයක් වන්නේය.
D- ක්‍රියාත්මක වන්නේ ජනතා කැමැත්ත පදනම් කොටගෙනය.
E- රාජ්‍යයකින් තොරව නීතියට හා පුද්ගලයාට පැවැත්මක් නොමැත.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

14) බලතල බෙදීම හා අදාළ නිවැරදි ප්‍රකාශයක් වන්නේ,

A- විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණය අතර බලය බෙදීම.

B- සන්ධිය රාජ්‍යයක සන්ධිය කොටස් අතර බලය බෙදීමේ පදනම එය වේ.

C- ඒ මිනිස් නිදහස ආරක්ෂා කිරීම සඳහා බලතල බෙදීම අවශ්‍ය බව

D- ව්‍යවස්ථාදායක, විධායක අධිකරණ කාර්යයන් එකිනෙකට වෙනස් පුද්ගලයන් හෝ කණ්ඩායම් විසින් හැසිරවිය යුතු බව පිළිගැනීම.

E- මෙම සංකල්පය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට න්‍යායාත්මක පදනමක් සපයයි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

15) නීතියේ අධිපතත්වය මගින් ප්‍රකාශ වන්නේ,

A- නීතිය ඉදිරියේ සියලුම මිනිසුන් එක හා සමාන වන බවය.

B- නීතිය ඉදිරියේ වරප්‍රසාද සහිත පංතියක් නොමැති බවය.

C- නීතිය කඩ කරන සියලුදෙනාට එක හා සමාන ලෙස දඬුවමට ලක්වන බවට

D- අයිතිවාසිකම් නීතියේ ප්‍රතිඵලයක් වන බවය.

E- රාජ්‍ය පාලනයේ දී පොදු නීතිය උත්තරීතර වීම.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

16) පොලිස් රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ වූයේ,

A- සමාජ සාමූහික වාදය

B- පුද්ගලවාදය

C- රාජ්‍යයේ අවම පාලනය

D- මිනිස් පෞද්ගලිකත්වයේ ඉහළම වටිනාකම පිළිගැනීම.

E- දේශපාලන වශයෙන් ලිබරල්වාදී වීම.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

17) සුභසාධන රාජ්‍ය ක්‍රමය,

A- දෙවන ලෝක යුද්ධයට පසුව පැමිණියේය.

B- ජනතාවගේ සුභසාධනය ඉහළ නැංවීම අරමුණු කරගෙන තිබේ.

C- ආර්ථික කටයුතුවලට මැදිහත් නොවේ.

D- සමාජ සමානාත්මතාව ඉතාම ඉහළින් පිළිගැනේ.

E- ආර්ථික න්‍යාය සපයන ලද්දේ ජෝන් මේනාඩ් කේන්ස් ය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

18) ජනාධිපති ආණ්ඩුක්‍රමය කෙරෙහි අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A- බලතල බෙදීමේ න්‍යාය මත එය ගොඩනඟා ඇත.

B- එකිනෙකට වෙනස් මැතිවරණ දෙකකින් ව්‍යවස්ථාදායක හා විධායකය තෝරා ගනී.

C- ව්‍යවස්ථාවෙන් සහතික කරන ලද නියමිත කාලය තුළදී ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කළ නොහැක.

D- විධායක ව්‍යවස්ථාදායක සම්බන්ධතා දුරස්ථ.

E- රාජ්‍යයේ නායකයා හා ආණ්ඩුවේ නායකයා යන තනතුරු දෙකම ජනාධිපති නිලය වෙත ඒකරාශි කර ඇත.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

19) කැබිනට් ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,

A- විධායක නාමික හා සත්‍යය යන අංග දෙකකින් සමන්විතය.

B- නාමික විධායකය රාජ්‍යයේ හා විධායකයේ ප්‍රධානියා ය.

C- සියලුම විධායක කාර්යයන් කරනු ලබන්නේ නාමික විධායකයේ නමිනි.

D- සත්‍ය විධායකය කරන්නා වූ විධායක කාර්යයන් වෙනුවෙන් නාමික විධායකය පාර්ලිමේන්තුවට වගකිව යුතුය.

E- සත්‍ය විධායකය සමන්විත වන්නේ අගමැති හා කැබිනට් මණ්ඩලයෙනි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

20) අයිතිවාසිකම් පිළිබඳ සංකල්පයට අදාළ වන්නේ,

A- අයිතිවාසිකම් යනු සමාජ පිළිගැනුම ලබාගත් පුද්ගයන්ගේ ඉල්ලීම ය.

B- රාජ්‍යයේ පිළිගැනුම ලැබුණු පසු පමණක් ඒවා අර්ථවත් වේ.

C- අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නීති අවශ්‍ය වේ.

D- නීති මගින් ඕනෑම ඉල්ලීමක් අයිතිවාසිකම් බවට පත්කළ හැකිය.

E- සමාජයේ ජීවත් වන සෑම පුද්ගලයෙකුට අයිතිවාසිකම් වලට හිමිකම් ඇත.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

21) සන්ධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයන්ය.

A- ලිඛිත ව්‍යවස්ථාව සහ එහි උත්තරීභාවය

B- මධ්‍යම ආණ්ඩුව හා සන්ධීය කොටස් අතර බලය බෙදීම.

C- තමන්ගේ බල ක්ෂේත්‍රය තුළ මධ්‍යම ආණ්ඩුව සහ සන්ධීය ඒකක ස්වාධීන වීම.

D- භූමිය හා ජනගහනය මත සන්ධීය ඒකක වලට අසමාන ලෙස සැලකීම.

E- ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

22) ඒකීය ආණ්ඩුක්‍රමයට අදාළ වන්නේ,

A- මුළු රටම සඳහා තනිබල මධ්‍යස්ථානයක් තිබීම.

B- මධ්‍යම ආණ්ඩුව හා පළාත් ආයතන අතර ස්වාධිපති බලය යෙදීම.

C- නීතිය, ප්‍රතිපත්ති හා පරිපාලන ඒකීයත්වය

D- නොබෙදුණු රාජ්‍යය පක්ෂපාතිභාවය

E- පරිපාලන ඒකීයත්වය පවත්වාගෙන යාමට එය උපකාරී වේ.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

23) දේශපාලන පක්ෂ,

A- ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍යම මූලිකාංගයක් වේ.

B- ඒවා මගින් මැතිවරණ සඳහා අපේක්ෂයින් තෝරා ඉදිරිපත් කරනු ලැබේ.

C- ඒවා සංවිධානය කර තිබෙන්නේ පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ය.

D- ඒවා රාජ්‍ය අල්ලා ගැනීම අරමුණු කොටගෙන සංවිධානය කර තිබේ.

E- ඒවා මගින් විසිරී ඇති මහජන මතය ඒකරාශි කරයි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

24) මහජන මතය කෙරෙහි අදාළ ප්‍රකාශයන්ය.

A- එය ජනතා හඬ හෝ ආශාවන් ප්‍රකාශ කිරීම යනුවෙන් ද ප්‍රකට ය.

B- ආණ්ඩුව හා එහි ක්‍රියාකාරකම් පිළිබඳව ජනතාව සිතන ආකාරය එමඟින් පිළිඹිබු වේ.

C- ආණ්ඩුවේ කාර්යය සාධනය තක්සේරු කිරීමට එය උපකාරී වේ.

D- එමඟින් ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කරනු ලැබේ.

E- මහජන මතය හැඩ ගැස්වීම කෙරෙහි ජනමාධ්‍ය විශාල කාර්යය භාරයක් ඉටුකරයි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

25) බලපෑම් කණ්ඩායම්

A- ආණ්ඩුවට බලපෑම් කරවීමේ ඒජන්තවරුන් වේ.

B- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ආණ්ඩුවට තොරතුරු සපයනු ලැබේ.

C- ඒවා සංවිධානය කර තිබෙන්නේ පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා ය.

D- රාජ්‍ය බලය අල්ලා ගැනීම අරමුණු කොටගත් දේශපාලන සංවිධාන වේ.

E- ආශා කණ්ඩායම් ලෙසද හැඳින්වේ.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

- **ප්‍රශ්න අංක. 26 සිට 30 දක්වා ප්‍රශ්න වලට ප්‍රකාශ දෙකක් දී ඇත. එක් එක් ප්‍රකාශ යුගලට ගැළපෙන්නේ පහත වගුවේ (1), (2), (3), (4) (5) යන කවර හැඳින්වීම දැයි සඳහන් කරන්න.**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| (1) | සත්‍යය. | සත්‍යය. |
| (2) | සත්‍යය. | අසත්‍යය. |
| (3) | අසත්‍යය. | සත්‍යය. |
| (4) | අසත්‍යය. | අසත්‍යය. |
| (5) | සත්‍යය. | විස්තර කරයි. |

| | ප්‍රකාශය I | ප්‍රකාශය II | |
|---|---|---|---|
| (26) | බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් විසින් පනවනු ලැබුවේ නැත. | බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය වැඩි කොටසක් නොලියැවුණු, සම්ප්‍රදායන් මත ව්‍යවස්ථාවක් ලෙස සලකනු ලැබේ. | (........) |
| (27) | නියත බහුතර ඡන්ද ක්‍රමයක් මගින් ප්‍රංශ ජනාධිපතිවරයා වසර පහක කාලයකට තෝරාපත් කර ගනු ලැබේ. | රාජ්‍ය බලය නියාමනය, ජාතික ස්වාධීන්තවයේ ආරක්ෂා කිරීම හා රාජ්‍යයේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම යන කෘත්‍යයන් ප්‍රංශ ජනපතිට හිමිය. | (........) |
| (28) | ඉන්දිය අගමැති නාමික විධායකය විසින් පත්කරයි. | ඉන්දිය අගමැතිවරයා අනිවාර්යයෙන්ම එරට රාජ සභාවේ සාමාජියෙකු විය යුතුය. | (........) |
| (29) | රාජ සභාවක් විසින් නාමකරණය කළ සාමාජිකයින්ගෙන් යුතු ඡන්ද විද්‍යාලයකින් ඉන්දිය ජනපති තෝරයි. | ඉන්දිය ජනපති අගමැති උපදෙස් මත ක්‍රියාකරයි. | (........) |
| (30) | ඇමෙරිකාව ප්‍රාන්ත රාජ්‍ය 50 කින් සමන්විත සහ සන්ධිය රාජ්‍යයකි. | ප්‍රාන්ත රාජ්‍යයන්ට වෙන් වී යාමේ අයිතිය ව්‍යවස්ථාවෙන් සහතික කර ඇත. | (........) |

- ප්‍රශ්න අංක. **31** සිට **36** දක්වා මාතෘකාවට සම්බන්ධ ප්‍රකාශන පහක් දී ඇත. ඉන් හතරක් සාවද්‍යයි සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

31) අන්තර් ජාතික දේශපාලනය යනු,

A- නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.

B- අන්තර් ජාතික සමාජයේ පුද්ගල කණ්ඩායම් අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.

C- අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.

D- අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.

E- බහුජාතික සමාගම් අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

32) රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරන්නේ,

A- පුද්ගලයෙකු විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.

B- පුද්ගල කණ්ඩායමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.

C- ව්‍යාපාරික සමාගමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.

D- කුටුම්භයක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.

E- ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

33) සමාජ ගැටුමක් යනු,

A- පුද්ගලයා තුළ ඇතිවන ගැටුමක් ය.

B- පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන ගැටුමක් ය.

C- සංවිධාන දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.

D- සමාජ කණ්ඩායම් දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.

E- රටවල් දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

The National e-learning Portal for The General Education

34) රාජකාරි ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් වූයේ,

A- කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

B- මැනිං ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

C- මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

D- ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

E- සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

35) ලංකාවේ ජාතික ව්‍යාපාරය,

A- ලංකාවට පූර්ණ නිදහස ලබාගැනීමට දැඩි උද්ඝෝෂණවල යෙදුනේය.

B- ජාතික අනුකලනය ගොඩ නැඟීමට දැඩි ලෙස උනන්දු විය.

C- බටහිරකරණයට ලක්වූ සමාජ ප්‍රභූන් නායකත්වය දුන් සාමකාමී ව්‍යාපාරයකි.

D- සමාජයේ සෑම සමාජීය කණ්ඩායමක් සහභාගී වූ ජනතා ව්‍යාපාරයකි.

E- ඉන්දීය ජාතික ව්‍යාපාරයට බෙහෙවින්ම සමාන විය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

(............)

- **ප්‍රශ්න අංක. 36 සිට 40 දක්වා මාතෘකාවට සම්බන්ධ ප්‍රකාශන පහක් දී ඇත. ඉන් හතරක් නිවැරදිය. එම නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

36) වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් දීමට ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මැලි වූයේ,

A- දේශීය දේශපාලනඥයින් දේශපාලනික පරිනත නොවූ බැවිනි.

B- ජනතාව තුළ එක්සත් භාවයක් නොතිබූ බැවිනි.

C- පොදු ජනතාවගේ දේශපාලන සහභාගිත්වය පහළ මට්ටමක පැවතිම.

D- වගකීම් සහිත ආණ්ඩුක්‍රමයකට බර්ගර් ජනතාව දැක්වූ විරුද්ධත්වය යි.

E- සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් නොතිබීම.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD (............)

37) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය,

A- කැබිනට් අමාත්‍ය මණ්ඩලය ලෙස හැඳින්විය.

B- අග්‍රානාණ්ඩුව විසින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් අතුරින් පත්කෙරුනි.

C- අගමැති නමින් හැඳින්වුනු ඇමතිවරයෙකුගේ නායකත්වය යටතේ පැවතුනි.

D- පාර්ලිමේන්තු සාමූහිකව වගකිව යුතුය.

E- ව්‍යවස්ථාදායකය විසින් සම්මත කළ විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කළ හැකිය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD (............)

38) සෝල්බරි ව්‍යවස්ථාවෙන් සුළු ජන අයිතින් රැකිමට යෙදූ විධිවිධාන වූයේ,

A- 29 (2) වගන්තිය

B- සෙනෙට් සභාව

C- බහුමන්ත්‍රී ජන්ද කොට්ඨාස

D- මූලික අයිතිවාසිකම් ඇතුළත් කළ පරිච්ඡේදය

E- ස්වාධීන අධිකරණයක් පවත්වා ගැනිම.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD (............)

39) 1972 ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග වූයේ,

A- ශ්‍රී ලංකා රාජ්‍යයක් අනගාමික ස්වරූපය වෙනස් කිරිම.

B- ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කිරීම.

C- අධිකරණයේ හා රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අවප්‍රමාණය කිරිම.

D- අධිකරණයෙහි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස හඳුන්වා දීම.

E- ........................................ ආකෘතියෙන් පූර්ණ ලෙස බිඳියාම සනිටුහන් කළේය.

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD (............)

40) 1978 ව්‍යවස්ථාවේ 105 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය සමන්විත වන්නේ,

A- ශ්‍රේෂ්ඨාධිකරණය

B- අභියානාධිකරණය

C- මහාධිකරණය

D- කාති විනිශ්චය සභා

E- පාර්ලිමේන්තුව විසින් කලින් කළ නියම කොට පිහිටුවන වෙනත් මුල් අවස්ථා අධිකරණ

1) ABCE 2) BCDE 3) ACDE 4) ABDE 5) ABCD

- **ප්‍රශ්න අංක. 41 සිට 50 දක්වා තිබෙන දී ඇති ප්‍රකාශ වලින් හතරක් නිරවද්‍ය වේ. ඉන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

41) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයන් හි නිර්දේශය වූයේ,

1) සියළු වෙළඳ ඒකාධිකාරය අවසන් කිරිම.

2) යුරෝපියන්ට කොළඹින් පිට ඉඩම් ගැනීමට තිබූ තංහවි ඉවත් කිරීම.

3) යටත් විජිත පාලනයේ නිළධාරීන් වාණිජ කටයුතුවල යෙදවීම.

4) උඩරට පළාත්වල ගෙන ගිය වෙනම පාලනය අවසන් කිරීම.

5) ආණ්ඩුකාරවරයා විධායක සභාව හා ව්‍යවස්ථාදායක සභාවක් සමග රට කරන විධායකයකු බවට පත් කිරීම.

42) 1924 මැනිං ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණයකි.
1) ඡන්ද බලය පිරිමින්ට පමණක් සීමාවිය.
2) ඡන්ද අපේක්ෂයෙකු වීමට රු. 25,000/- ක වාර්ෂික ආදායම්ලාභියෙකු වීම.
3) ව්‍යවස්ථාදායක මුදල් නිති පැනවීමේ බලය හිමි නොවීම.
4) විධායක මණ්ඩලය ආණ්ඩුකරුගේ උපදේශක මණ්ඩලයක් වීම.
5) වගකීමෙන් තොර බලයත් බලයෙන් තොර වගකීමත් මත පදනම් වීම.

43) ලංකාවේ වාමාංශික ව්‍යාපාරය,
1) දිගුකාලීන අරමුණක් වූයේ සමාජවාදී සමාජයක් ගොඩනැගීම.
2) කම්කරු ව්‍යාපාරයේ හිදැස් පිරවීම ආරම්භයේදී ම සිදුකළේය.
3) අධිරාජ්‍ය විරෝධී මහජන ව්‍යාපාරයක් ගොඩනැගීමට සමත් විය.
4) ලෝක සමාජවාදී මතවාදයන් සමග බෙදී යාමට ලක්විය.
5) පළමුවරට දේශපාලන ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කළේය.

44) ඩොනමෝර් ආණ්ඩුකරු සතු විධායක සහතික කිරීමේ බලතල වූයේ,
1) අනුමත කිරීම.
2) මහරජුගේ අනුමැතිය සඳහා රඳවා තැබීම.
3) වලංගු වන දිනය මාස තුනක් දක්වා කල් දැමීම.
4) අනුමැතිය නොදී නිශේධනය
5) නැවත සලකා බැලීමට ආපසු රාජ්‍ය මන්ත්‍රණ සභාවට යැවීම.

45) 1972 ව්‍යවස්ථාදායක තත්ත්වයන් වන්නේ,
1) නිල කාලය වසර 6 කි.
2) ජනරජයේ උත්තරීතරම ආයතනය යි.
3) ව්‍යවස්ථාදායකය සතු බලතල පැවරීමට හෝ අත්හැරීමට නොහැකිය.
4) ත්‍රිවිධ බලතල ඒකරාශි කර තිබූ ආයතනය කි.
5) සියලුම සභිකයන් මහජන ඡන්දයෙන් තේරීම අවශ්‍ය නොවිය.

46) 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සතුව පැවති පාර්ලිමේන්තුව හා සම්බන්ධ බලතල වූයේ,
1) පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ නව පාර්ලිමේන්තුවට වසරක් ගෙවුනු පසුවයි.
2) ජනාධිපතිට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන එනවිට විසුරුවා හැරිය හැකිය.
3) අයවැය ලේඛනය පළමුවර කියවා ප්‍රතික්ෂේප වීමට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකිය.
4) රාජ්‍යයක් ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්මත නොවූ විට විසුරුවා හැරිය හැකිය.
5) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ ජනාධිපති මුලසුන දැරිය යුතුය.

47) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ,
1) අඛණ්ඩව පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.
2) පොරපිටියේ කැපී පෙනෙන්නේ ප්‍රධාන පක්ෂ කීපයක් ............... පමණි.
3) වාමාංශික දේශපාලන පක්ෂවල කඩාකප්පල් වීමක් දැකිය හැකිය.
4) පක්ෂ මාරු කිරීම තහනම් විය.
5) වර්තමානය වන විට ජනතා විමුක්ති පෙරමුණ වාමාංශික පක්ෂ අතර ඉදිරියෙන් සිටීම.

48) පළාත්සභා ආණ්ඩුකරු සතු බලතලයකි,
1) පළාත් සභාව ඇමතීම හා පණිවිඩ යැවිය හැකිය.
2) ප්‍රඥප්ති වලට අනුමැතිය ලබා දෙයි.
3) පළාත් මූල්‍ය කළමනාකරණ කරයි.
4) පළාත් මහ ඇමති මණ්ඩලය පත් කරයි.
5) විධායක බලය ඍජුවම ක්‍රියාවට නඟයි.

49) ශ්‍රී ලංකාවේ ජනමත විචාරණයට යොමු කරනු ලබන්නේ,
1) පාර්ලිමේන්තුව විසින් සම්මත නොකළ එකක් පමණි.
2) ජාතික වශයෙන් වැදගත් යැයි ජනාධිපතිවරයා හිතන පතන්
3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 වගන්තියෙන් නිර්දේශ කර ඇති කෙටුම්පත්
4) සරල බහුතරය ගත් මතය ජයග්‍රහණය කරයි.
5) පැවැත්වූ එකම හා ප්‍රථම ජනමත විචාරණය පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කිරීමට හේතු විය.

50) වත්මන් ව්‍යවස්ථාවේ අධිකරණයේ ස්වාධීනත්වය යොදා ඇති විධිවිධාන වන්නේ,
1) විනිසුරුන්ගේ විශ්‍රාම යෑමේ වයස ව්‍යවස්ථාවෙන් දක්වා තිබීම.
2) විනිසුරුවන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින්ම වෙන් කරලීම.
3) විනිසුරුන්ගේ ඉල්ලීම පරිදි විශ්‍රාමලාභීන්ගේ වයස් වෙන් කිරීමට හැකි වීම.
4) පහළ අධිකරණවලට විනිසුරුවන් පත් කිරීම මාරු කිරීම උසස් කිරීම අධිකරණ සේවා කොමිසමට පැවරීම.
5) අධිකරණ සේවා කොමිෂමට බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

ඩී.එස්. සේනානායක විද්‍යාලය කොළඹ 07.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

## දෙවන වාර පරීක්ෂණය - 2016

## 13 ශ්‍රේණිය

## දේශපාලන විද්‍යාව

## II කොටස

කාලය පැය 2 යි.

නම: ........................................................................ අංකය:- ................ පන්තිය:- ..........

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ. A කොටසේ සියළුම ප්‍රශ්නවලට එහිම පිළිතුරු ලියන්න. B හා C කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

### A - කොටස

එක් ප්‍රශ්නයකට එක ලකුණ බැගින් ප්‍රශ්න 20 ට ලකුණු 20 ක් හිමි වේ.

01) පහත සඳහන් කෘතින් ලියන ලද කතුවරුන් නම් කරන්න.

i) සමුහාණ්ඩුව - ..............................

ii) දේශපාලන ව්‍යාකරණය - ..............................

02) දාර්ශනික අධ්‍යයන ක්‍රමයේ වාසියක් සහ අවාසියක් දක්වන්න.

i) ..............................

ii) ..............................

03) නූතන ජාතික රාජ්‍ය තෙක් රාජ්‍ය විකාශනයේ දී පසුකාලීන අවධීන් දෙකක් සඳහන් කරන්න.

i) ..............................

ii) ..............................

04) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අත්‍යවශ්‍යයෙන් පැවතිය යුතු අංග දෙකක් ලියන්න.

i) ..............................

ii) ..............................

05) මහජන මතය තීරණය වීමෙහි ලා බලපාන සාධක දෙකක් ලියන්න.

i) ..............................

ii) ..............................

06) මිනිසුන් නීතියට අවනත වීම පිළිබඳ ඉදිරිපත්ව ඇති ප්‍රධාන මතවාද දෙක ලියන්න.

i) ..............................

ii) ..............................

07) දේශපාලන පක්ෂයක කාර්යභාරයන් දෙකක් දක්වන්න.

i) ..............................

ii) ..............................

08) කැබිනට් ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

i) ..................................................

ii) ..................................................

09) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතු යැයි පොදුවේ පිළිගැනෙන කරුණු දෙකක් ලියන්න.

i) ..................................................

ii) ..................................................

10) දෙවන මණ්ඩල ක්‍රමයට එරෙහිව ඉදිරිපත් වී ඇති විවේචන දෙකක් දෙන්න.

i) ..................................................

ii) ..................................................

11) කෝල්බෲක් යෝජනාවක් වූ ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම නිසා අත්වූ වාසි දෙකක් සඳහන් කරන්න.

i) ..................................................

ii) ..................................................

12) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ආණ්ඩුකාරවරයා සතුවූ ව්‍යවස්ථාදායක බලතල දෙකක් සඳහන් කරන්න.

i) ..................................................

ii) ..................................................

13) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුළු ජාතික අයිතිවාසිකමක් ආරක්ෂා කිරීමට යෙදූ අසාර්ථක උපාය මාර්ග දෙකක් දක්වන්න.

i) ..................................................

ii) ..................................................

14) 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ නිල කාලය කොපමණ ද?

..................................................

ජනාධිපතිගේ නිල කාලය කොපමණ ද?

..................................................

15) සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රබලතා දෙකක් දක්වන්න.

i) ..................................................

ii) ..................................................

16) ජනමත විචාරණයට යොමු කළ වන හැකිවන්නේ කෙබඳු යෝජනාවක් ද?

i) ..................................................

ii) ..................................................

17) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වයට වාදකාරී වූ විධිවිධාන මොනවාද?

i) ..................................................

ii) ..................................................

18) ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල දෙකක් නම් කරන්න.

i) ..............................................................................................................

ii) ..............................................................................................................

19) ශ්‍රී ලංකාව තුළ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ව්‍යවස්ථාමය වශයෙන් යොදා ඇති විධිවිධාන දෙකක් දක්වන්න.

i) ..............................................................................................................

ii) ..............................................................................................................

20) එටිකා ගිවිසුමේ ඇති කොන්දේසි දෙකක් දක්වන්න.

i) ..............................................................................................................

ii) ..............................................................................................................

## B - කොටස

01) දේශපාලනය අධ්‍යයනය කිරීම පරිභ්‍රමණය වන්නේ රාජ්‍ය වටාය. ඔබ එකඟ වන්නේද ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02) පහත දැක්වෙන ඒවායින් දෙකක් විභාග කරන්න.

i) ව්‍යවස්ථානුකූල වාදය

ii) කැබිනට් ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ

iii) නීතියේ මූලාශ්‍ර

iv) නූතන ආණ්ඩුවල විධායකය ව්‍යවස්ථාදායක අභිබවා ඇත.

03) පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පහදන්න.

i) ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්

ii) ප්‍රංශ අගමැතිවරයාගේ බලතල හා කාර්යයන්

iii) මහා බ්‍රිතාන්‍යයේ අගමැතිවරයාගේ බලතල හා කාර්යයන්

iv) ඉන්දීය ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්

04) සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.

## C - කොටස

05) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම නිසා ඇතිවූ යහපත් හා අයහපත් ප්‍රතිවිපාකයන් දක්වන්න.

06) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ

i) ව්‍යවස්ථාදායකය

ii) විධායකය

iii) ව්‍යවස්ථාදායකය සංයුතිය හා කාර්යය භාරය පිළිබඳ විමසුමක් කරන්න.

07) 1978 විධායක ජනාධිපති පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

08) i) දකුණු ආසියාතික කලාපීය සහයෝගිතා සංවිධානය

ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ශ්‍රී ලංකාව

iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ

iv) ව්‍යවස්ථාදායක සභාව

********